


# ශීතකරණ කාර්මික ශිල්පී / REFRIGERATION TECHNICIAN

ශ්‍රී ලංකන් කේටරින් සමාගම, ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ පූර්ණ උප සමාගමක් වන අතර ISO 9001 : 2015, ISO 14001 : 2015, ISO 22000 : 2018 (HACCP) යන තත්ව සහතික හිමිකරගෙන ඇති ජාත්‍යන්තර සහ දේශීය සම්මාන රැසකින් පිදුම් ලැබූ සමාගමකි. අති නවීන අංගෝපාංග වලින් පිරි මුළුතැන්ගෙයකින් සහ අවන්හලකින් සමන්විත අප ආයතනය ගුවන් යානා සඳහා ආහාර පාන සැපයුම් කරන ශ්‍රී ලංකාවේ පිහිටි එකම සමාගමයි.

අප සමාගමේ පහත තනතුර සඳහා දක්ෂතා සහිත කාර්යශූර අයවළුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබයි.

**අවශ්‍ය සුදුසුකම්:**

- පිළිගත් ආයතනයක ශීතකරණ සහ වායුසමීකරණ ශිල්පය පිළිබඳ වසර 03 කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම.
- පාඨමාලාව නිම කිරීමෙන් පසු අදාල ක්ෂේත්‍රයේ වසර 04 කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.
- සියළුම ශීතකරණ පද්ධති හා උපකරණ, ශීතාගාර, AHU, විදුලි සම්ප්‍රේෂණ පද්ධති පිළිබඳ මනා දැනුමක් තිබීම.
- වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු අතර අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව විෂයන් 06 කින් සමත්ව තිබීම.

**පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ:**

- CCTV කැමරා පද්ධති.
- මුළුතැන්ගෙයි උපකරණ නඩත්තුව සහ ඒවායේ ක්‍රියාකාරීත්වය.
- ගිනි ආරක්ෂණ පද්ධති සහ ගිනි නිවීමේ පද්ධති.
- වැඩබිම් ආරක්ෂාව සහ විදුලි ආරක්ෂිත ක්‍රමවේද.
- ISO තත්ත්ව පාලන ප්‍රමිති.

මෙම තනතුර සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ආහාරපාන, නිල ඇඳුම්, ගමන් පහසුකම්, වෛද්‍යාධාර, ආකර්ෂණීය වැටුප් තල ඇතුළු තවත් පහසුකම් රැසක් හිමිවන අතර සේවා මුර ක්‍රමය අනුව රාජකාරි කළ යුතුය.

ඉහත සුදුසුකම් සපුරා ඇත්නම් ඔබගේ අයදුම්පත, මෑතකදී ලබාගත් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් සමග ඔබගේ දුරකථන අංකය සහ අනෙකුත් විස්තර සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයක් සහ දුරකථන අංක ද සහිතව දින 10 ක් ඇතුළත පහත ලිපිනයට හෝ ඊ මේල් ලිපිනයට යොමු කරන්න.

අයදුම්කරන තනතුර ලියුම් කවරයේ හා අයදුම්පතේ වම් පස ඉහළින් සඳහන් කරන්න. ඊ මේල් නම් විෂය (Subject) යටතේ අයදුම්කරන තනතුර යොදන්න.

ඉහත තනතුර සම්බන්ධයෙන් කිසියම් හෝ ආකාරයක බලපෑමක් සිදු කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මානව සම්පත් සහ පරිපාලන**
**ශ්‍රී ලංකන් කේටරින් සමාගම**
**තැ.පෙ. 07**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ**
**කටුනායක**

Email: careers@srilankancatering.com

SriLankan Catering